මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| පුරවැසි අධ්‍යාපනය | 7 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** ..........................................................................................................................

## I පත්‍රය

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 5 දක්වා ප්‍රකාශන හරිනම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද, ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

1. නිවස හැරුනු විට දරුවෙකුට වඩාත් හුරු පුරුදු පරිසරය පන්සලයි. (................)
2. ආගමික කටයුතුවල යෙදීමෙන් අයහපත් චිත්තවේග මඟහරවා ගත හැකි ය. (................)
3. ජන සමාජයක කුඩාම ඒකකය පවුලයි . (................)
4. පාසලක ඉතිහාසය සෙවීමේ දී සමරු ඵලක ඉතා වැදගත් වේ . (................)
5. සොබා දහමින් ලබාදී ඇති සම්පත් ප්‍රවේශමෙන් පරිහරණය කළ යුතුයි. (................)

- අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළ ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

6. අතිශය නාගරික සංකීර්ණ පරිසරයක් සහිත බල ප්‍රදේශය ...............................ලෙස හැඳින්වේ.
7. පරිඝනකය, රූපවාහිනිය අනවශ්‍ය ලෙස භාවිතා කිරීමෙන් .................................ප්‍රතිඵල ඇතිවේ.
8. ජන සමාජයක් ගොඩ නැගෙන්නේ ................................. ඒකක රාශියකිනි.
9. සමාජය තුළ ඔබට හිමිවන ස්ථානය තීරණය කරන්නේ ඔබ ලබන .............................. මතයි.
10. අප විසින් අත්හල යුතු දෑ ................................................. ලෙස හැඳින්වේ.

(අහිතකර, පවුල්, මහනගර සභා, විරිත්, අධ්‍යාපනය මතයි)

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා I කොටසේ ඇති ප්‍රකාශවලට ගැලපෙන ප්‍රකාශ II කොටසින් තෝරන්න.

| I කොටස | II කොටස |
|---|---|
| 11. පුද්ගලයෙකු සුවිශේෂීව හඳුනා ගැනීම | වගකීම |
| 12. පුද්ගලයෙකු තුළ ඇති සුවිශේෂී තත්වයකි | කළයුතු දේවල් |
| 13. අභියෝගයක් සාර්ථකව ජය ගැනීමට | පෙර සූදානම |
| 14. යුතුකම් ඉටු කිරීමට ඇති බැඳීම | ඩී. එන්. ඒ |
| 15. සිරිත් යනු | නිර්මාණශීලීත්වය |

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16. පුද්ගලයන් තුළ ඇතිවන අයහපත් චිත්තවේගී තත්වයකි.

    (1) දුක (2) කනගාටුව (3) පළිගැනීමේ තත්වය (4) සුසුම් හෙලීම

17. පාසලක ආදර්ශ පාඨය සැකසී ඇත්තේ,

    (1) අලංකාර වගන්තිවලින් ය. (2) පාසලේ අරමුණු ගොඩනැගෙන ලෙස ය.

    (3) සිසු ජීවිතවලට උචිත නිදර්ශනයන් ලෙස ය. (4) සිසු ජීවිත හැඩගස්වන ආදර්ශයන් ලෙස ය .

18. අපේ දිවි පැවැත්ම සඳහා අත්‍යාවශ්‍යම සම්පත් දෙකකි .

    (1) වාතය, ජලය (2) ජලය හා වාහන (3) හිරුඑළිය, වනාන්තර (4) ඛනිජ සම්පත් හා ජලය

19. මහා මාර්ගවල සංඥා පුවරු, ආරක්ෂිත වැට ආදිය ඉදිකර ඇත්තේ,

    (1) අලංකාරය පිණිසයි. (2) පදිකයන් ගේ පහසුව සඳහායි.

    (3) මාර්ග තදබදය වැලැක්වීමටයි. (4) මාර්ගය ප්‍රයෝජනයට ගන්නා අයගේ ආරක්ෂාව සඳහායි.

20. විනය හා ශික්ෂණය සඳහා ප්‍රගුණ කළයුතු ගුණාංගයක් නොවන්නේ

    (1) මිත්‍රශීලිබව (2) සහයෝගිබව (3) අකාරුණික බව (4) මානව දයාව

(ල-දෙක බැගින් 20 කි)

## II පත්‍රය

- පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්යය වේ.
- තවත් ප්‍රශ්න හතරක් තෝරා ගෙන පිළිතුරු ලියන්න.

01.

1. න්‍යෂ්ඨික පවුලක සාමාජිකයන් නම් කරන්න.
2. පවුලෙන් ඔබට ඉටුවන සේවාවන් දෙකක් ලියන්න.
3. ඔබේ පවුලට ඔබ ඉටු කළයුතු යුතුකම් දෙකක් නම් කරන්න.
4. ජීවිතයේ සාර්ථකත්වයට බලපාන හිතකර බලවේග දෙකක් ලියන්න.
5. පුද්ගලයෙකුගේ පිරිහීමට බලපාන කරුණු දෙකක් නම් කරන්න.
6. විවේකය ඵලදායි ලෙස ගත කිරීමට කළ හැකි සෞන්දර්ය ක්‍රියාකාරකම් දෙකක් ලියන්න.
7. පැරණි ජන ක්‍රීඩාවන් දෙකක් නම් කරන්න
8. පාසල් ශිෂ්‍යයකු වශයෙන් ඔබේ ජීවන අරමුණු දෙකක් ලියන්න.

(ල-දෙක බැගින් 16කි)

02. 1. පවුලෙන් ඔබට ලැබෙන අයිතිවාසිකම් දෙකක් ලියන්න.

2. දෙමව්පියන්ට ඉටුකළයුතු යුතුකම් හතරක් නම් කරන්න.

3. යහපත් පුරවැසියකු වශයෙන් ඔබ සතු විය යුතු ගුණාංග පහක් ලියන්න.

(ලකුණු 2 +4+5)=11

03. 1. විවේකය අර්ථවත්ව ගත කිරීමට කළ හැකි ක්‍රියාකාරකම් දෙකක් ලියන්න.

2. පවුලේ සාමාජිකයකු ලෙස ඔබට මුහුණදීමට සිදුවිය හැකි අභියෝග 4ක් නම් කරන්න.

3. ක්‍රීඩාවක යෙදීමෙන් ඔබ තුළ ඇතිකර ගතහැකි යහපත් ගුණාංග කෙටියෙන් ලියන්න.

04. 1. ඔබ දුකට පත් වූ විට දක්වන ප්‍රතික්‍රියා දෙකක් ලියන්න.

2. යහපත් චිත්තවේග පාලනයට කළහැකි ක්‍රියාකාරකම් හතරක් ලියන්න.

3. පාරිභෝගිකයකු ගුණාත්මක භාණ්ඩ මිල දී ගැනීම සඳහා අනුගමනය කළ යුතු දේවල් කෙටියෙන් ලියන්න.

05. 1. අයිතිවාසිකම්වල ලක්ෂණ දෙකක් ලියන්න.

2. සිවිල් අයිතිවාසිකම් දෙකක් ලියන්න.

3. දේශපාලන අයිතිවාසිකම් 5ක් දක්වන්න.

06. 1. ජීවිතයේ අභියෝගවලට මුහුණදීමට ඇති කළ යුතු ගුණාංග දෙකක් ලියන්න.

2. රටේ පවතින නීතිමය යුතුකම් දෙකක් ලියන්න.

3. වර්තමාන පවුල් ඒකක මුහුණදෙන අභියෝග 4ක් ලියන්න .

07. 1. රාජ්‍යය තොරතුරු කේන්ද්‍රය ඇමතිය හැකි සෘජු දුරකථන අංකය කුමක් ද?

2. භාණ්ඩයක් මිලදී ගැනීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු 4ක් ලියන්න.

3. ළමා ශ්‍රමිකයන් සේවයේ යෙදීමෙන් ඇතිවිය හැකි බලපෑම් කෙටියෙන් ලියන්න.